# සිතාරාගේ සිහිනය




ආර්.බී. රශ්මි ප්‍රබෝදා

# සිතාරාගේ සිහිනය

ආර්.බී. රශ්මි ප්‍රබෝදා

මහ/මහමායා බාලිකා විදුහල

2 ශ්‍රේණිය A

කතාව සහ චිත්‍ර

ආර්.බී. රශ්මි ප්‍රබෝදා

ISBN 978-624-208-257-8

කෘතිය පළ කරන දින

2025.02.08

කතෘගේ වෙනත් කෘති

කතා කරන බෝනික්කා

කතෘ ප්‍රකාශනයකි

2025

# පිදුම

සිප් සතර කියාදුන්

දමයන්ති රත්නායක

ගුරුතුමියටත්

සියලුම ගුරු මෑණිවරුන්ටත්

ගුරු පියවරුන්ටත්

දෙමව්පියන්ටත්

යෙහෙළියන්ටත්

ඉතා ආදරයෙන්

මෙම ග්‍රන්ථය

පුද කරමි

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භිකෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය .

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

සිතාරා පුංචි දරුවෙකි. ඇය ජීවත් වූයේ අත්තම්මා සමඟය. සිතාරාගේ මව හා පියා මිය ගිහින් දැනට අවුරුදු දෙකක් විය. පුංචි සිතාරාට අම්මා තාත්තා නැති අඩුව දැනෙන්න අත්තම්මා ඉඩ දුන්නේ නැහැ.



ගමේ පිට්ටනියේ සවස් වන විට යාළුවෝ සමග සිතාරා සෙල්ලම් කළා.



සෙල්ලම් කර අවසන් වූ සිතාරා අත්තම්මා සමග බුදුන් වැඳීමට පුරුදු වී සිටියා.



සිතාරා දිනපතාම රාත්‍රියට අහස බලාගෙන තරු සමග කතා කළා. සෑම දිනකම සිතාරා කතා කරන විට ලස්සන තරු දෙකක් අහසේ පායනවා.



තරු සමග කතා කළ සිතාරා නින්දට යන්නේ
කඳුළු පිරි දෙනෙතින්ය. ඇය පායන තරු
දෙක ඇයගේ අම්මා තාත්තා යැයි සිතයි.

උදෑසනින්ම අවදි වූ සිතාරා පාසැල් යාමට සූදානම් වුණා. වෙනදා මෙන් බුදුන් වැඳ අත්තම්මාගේද දෙපා වැඳ සිතාරා පාසලට පිටත් විය.

පාසලේ සීනුව නාද විය. උදෑසන රැස්වීම ආරම්භ විය. එදින කතාවක් පැවැත්වීමට සිටියේ සිතාරා. ඇය කතා කළේ ඇයගේ අනාගත බලාපොරොත්තුව ගැනය.

සිතාරා කතාව බොහොම ලස්සනට ඉදිරිපත් කළා. ඇයගේ සිහිනය වුනේ ගුරුවරියක් වී අසරණ දරුවන්ට පාසල් අධ්‍යාපනය ලබාදීමයි.

කාලය ගත වී ගියා. පුංචි සිතාරා දැන් ලොකු ළමයෙක්. ඇය විභාගය ඉහලින්ම සමත්විය. පුතේ දැන් සිහිනය සැබෑ කරගන්න බොහොම ළඟයි අත්තම්මා සිතාරාගේ හිස අතගාමින් කිව්වා.

සිතාරා වෙනදා මෙන් රාත්‍රී අහස දෙස බලා
කතා කරන විට සිතාරාට පෙනුණේ
සිතාරාගේ අනාගත සිහිනය. සිතාරාට පුදුම
සිතුණා. සිතාරා ඉක්මනින් දිව ගොස්
අත්තම්මාට සිදුවූ සියල්ල පැවසුවා.
අත්තම්මා සමග අහස බලපු සිතාරට ගොඩක්
සතුටු හිතුනා. පුතේ ඔයාගේ  සිහිනය
අහසේ  පෙනුණා කියමින්
දෙදෙනාම සතුටු වුනා.



කාලය ගත වී ගියා. සිතාරා ඉගෙනීම අවසන් කර ගුරුවරියක් විය. ඇය සිතූ ආකාරයට දරුවන්ට අධ්‍යාපනය දෙන ගුරුවරියක් විය. සිතාරාගේ සිහිනය සැබෑ විය.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන් , දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

**ISBN 978-624-208-257-8**